වාහන සම්බන්ධයෙන් සුවිශේෂී සේවා සපයන දූනගහ-මිනුවන්ගොඩ Sterling Auto City

දශකයකට ආසන්න කාලයක් පුරා වාහන සේවා සැපයුම් ක්ෂෙත්‍රය හා බැඳි කීර්තිමත් නාමයක් වන ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගම ජපන් වාහන සඳහා ප්‍රථම වරට Sterling Aftercare Guarantee වගකීම් සහතිකය පිරිනමමින් ලොව අංක එකේ රථවාහන වගකීම් සහතිකයකට හිමිකම් කියන්නට මෙරට වාහන හිමිකරුවන් වෙත අවස්ථාව උදා කර දෙන ලදී. ඉන් නොනැවතුණු ස්ටර්ලින් ඔටෝමොබයිල්ස් ලංකා (පුද්) සමාගම සියලුම වාහන හිමිකරුවන් සඳහා යුරෝපීය මාදිලියේ වාහනවල පූර්ණ සේවා සහ කාර්මික අලුත්වැඩියාවන් සැපයීමත් අලෙවියෙන් පසු සුවිශේෂී ප්‍රතිලාභ හිමිකර දෙන්නට ද ක්‍රියා කරන ලදී. එලෙස රථවාහන ක්ෂේත්‍රයේ නවීන තාක්ෂණය මුසු කළ සේවා ලාංකික ජනතාවට ලබා දුන් ස්ටර්ලින් ඔටෝ මොබයිල්ස් ලංකා (පුද්) සමාගමෙහි ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන විවිධ ප්‍රදේශයන්හි ස්ථාපිත කර තිබේ. මේ සියලු ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන අතරින් දූනගහ මිනුවන්ගොඩ පිහිටි Sterling Auto City මධ්‍යස්ථානය කරුණු කිහිපයක් නිසා මෙරට පාරිභෝගිකයන්ට විශේෂිත වේ. ඒ පිළිබඳව Sterling Aftercare Centre හි මෙහෙයුම් පිළිබඳ සහකාර සාමාන්‍යාධිකාරී එච්.බී. නිලන්ත සිරි මහතා සහ කළමනාකරු (Body Shop) ඒ.ජේ.එෆ්. වෝල්ටර් මහතා සමඟ කළ සාකච්ඡාවක් පහතින් දිග හැරේ.

දූනගහ-මිනුවන්ගොඩ පිහිටි Sterling Auto City මධ්‍යස්ථානය වාහන සම්බන්ධයෙන් සුවිශේෂී සේවා සපයනවා නේද?

ඔව්. දූනගහ-මිනුවන්ගොඩ පිහිටි Sterling Auto City මධ්‍යස්ථානය වාහන සම්බන්ධ සේවා සැපයීමට අමතරව විශේෂයෙන්ම රථවාහන අනතුරු නිසා හානි වූ වාහන බඳ ඇතුළු උපාංග නියමිත ප්‍රමිතියටම අලුත්වැඩියා කිරීම සිදු කරනවා. නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් Sterling Auto City මධ්‍යස්ථානයේදී ඇදවීමට ලක් වූ වාහන බඳ කොටස් පෙර පැවති තත්ත්වයටම පත් කිරීමේ හැකියාව පවතිනවා. ඒ සඳහාම විශේෂිත වූ නවීන යන්ත්‍රෝපකරණ අප සතුව තිබෙනවා. Car-O-Liner යන්ත්‍රය ඊට හොඳම උදාහරණයයි. ඉලෙක්ට්‍රොනික තාක්ෂණය ඔස්සේ ස්වයංක්‍රීයව වාහනයේ අලුත්වැඩියා කටයුත්ත කිරීමේ හැකියාව මේ යන්ත්‍රය නිසා පවතිනවා. යන්ත්‍රානුසාරයෙන්ම වාහනයේ ඇද වූ බඳ කොටස් සැකසීමට හැකිවීම එහි විශේෂත්වයයි. ඒ වගේම දූනගහ Sterling Auto City මධ්‍යස්ථානයේ නියම ප්‍රමිතියෙන් යුත් Automobile තීන්ත වර්ගත් වාහන සඳහා අපි භාවිත කරනවා.

අනතුරකට ලක්වූ වාහනයක් අලුත්වැඩියා කළ තත්ත්වය කරා රැගෙන ඒමේදී Sterling Auto City වෙතින් සිදුකරන කාර්යභාරය පැහැදිලි කළොත්...

වාහනයක් අනතුරකට ලක් වූ ඕනෑම අවස්ථාවකදී අදාළ වාහනය මිනුවන්ගොඩ-දූනගහ Sterling Auto City වෙත රැගෙන ඒමේ හැකියාව පාරිභෝගික ජනතාවට පවතිනවා. එලෙස රැගෙන ඒම සඳහා පහසුකම් නොමැතිනම් 0772 440 036 යන දුරකතන අංකවලට ඇමතීමෙන් අනතුරට ලක් වූ වාහනය Carrier මඟින් ඇදගෙන ඒමේ පහසුකම අප සපයා දෙනු ලබනවා. අනතුරට ලක්වූ වාහනය රක්ෂණය කර ඇත්නම්, වාහනය අලුත්වැඩියා කිරීම සඳහා වැයවන මුදල ඇස්තමේන්තු ගතකර ඒ රක්ෂණ සමාගමේ අනුමැතිය ලැබෙන තුරු අප මධ්‍යස්ථානයේ වාහනය ගාල් කර තැබිය හැකියි. අදාළ අනුමැතිය හිමිවූ පසුව වාහනයේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීම ආරම්භ කරනවා. ඒ අලුත්වැඩියා කටයුතු අතරතුර අප නියෝජිතයන් වාහනයේ ඡායාරූප පාරිභෝගිකයා වෙත යොමු කරමින් වාහනයේ තත්ත්වය පිළිබඳව පූර්ණ දැනුවත්භාවයක් ලබා දෙනවා.

සියලුම අලුත්වැඩියා කටයුතු අවසානයේදී වාහනය Service කර පාරිභෝගිකයාට ලබාදීම සිදුකරනවා. රක්ෂණය නොකළ වාහනයක් අපගේ Auto City මධ්‍යස්ථාන වෙත රැගෙන ආ මොහොතේ පටන් වාහනයේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කරනවා. අලුත්වැඩියා කටයුතු වලින් අනතුරුව යළි වාහනය පාරිභෝගිකයාට භාර දීමට පොරොන්දු වූ දිනයේ එය නියමිත පරිදි භාර දීම අප විසින් සිදු කරනවා.

මිනුවන්ගොඩ-දූනගහ Sterling Auto City වෙත පැමිණෙන පාරිභෝගිකයන්ගේ සුව පහසුව සඳහා සපයන සේවා මොනවාද?

සාමාන්‍යයෙන් වාහනයක පූර්ණ සේවා කටයුත්තක් සඳහා පැය 4-5 ක කාලයක් සේවා මධ්‍යස්ථානය තුළ ගෙවා දැමීමට පාරිභෝගිකයාට සිදු වෙනවා. එහිදී පාරිභෝගිකයාට අවශ්‍ය සියලු පහසුකම්වලින් සමන්විත Customer Lobby අපගේ සෑම සේවා මධ්‍යස්ථානයකම ඉදිකර තිබෙනවා. එහිදී අන්තර්ජාල පහසුකම්, රූපවාහිනී නැරඹීමේ හැකියාව, පාන වර්ග ලබා ගැනීමේ හැකියාව වැනි පහසුකම් අප සපයා තිබෙනවා. පාරිභෝගිකයන් සඳහා උපරිම පහසුව සහ නිදහස් සාමකාමී වටපිටාවක් සපයා දීම Customer Lobby හි අරමුණයි. දූනගහ Sterling Auto City මධ්‍යස්ථානය අක්කර 10.5 ක විශාල ඉඩකඩකයි ඉදිකර තිබෙන්නේ. අප මධ්‍යස්ථානය කරා පැමිණෙන පාරිභෝගිකයන්ට හැකි තරම් නිදහස් වටපිටාව අත්විඳින්නට අප අවස්ථාව සලසා දී තිබෙනවා. අපේ මධ්‍යස්ථානයේ විශාල ක්‍රීඩා පිට්ටනියක්, වොලිබෝල් පිට්යක් පවතිනවා. ඊට අමතරව ඉදිරියේදී අපේ සේවා දායකයන් වෙනුවෙන්ම පිහිනුම් තටාකයක් ඉදිවෙමින් පවතිනවා.

Sterling Aftercare Centre හි තාක්ෂණය පිළිබඳව සඳහන් කළොත්...

අප සමාගම සතු තාක්ෂණය පිළිබඳ සඳහන් කරනවා නම් දැනට ලංකාවේ වාහන Service කිරීම හා අලුත්වැඩියාව සම්බන්ධ නවීනතම තාක්ෂණය සහ ඊට අවශ්‍ය හොඳම අමුද්‍රව්‍ය, උපාංග අප සතුයි. ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථානවල සේවයේ නියුතු සියලු තාක්ෂණික සහ කාර්මික ශිල්පීන් ජපන් තාක්ෂණික දැනුමින් සන්නද්ධයි. විශේෂයෙන්ම ඔවුන් ඒ සම්බන්ධ දැනුමෙන් සහ පළපුරුද්දෙන් සමන්විතයි. අලුත්වැඩියාවන් සඳහා භාවිත කරන ඉහළම තත්ත්වයේ උපකරණ හා මෙවලම් අප සතුව තිබෙනවා. දූනගහ Sterling Auto City මධ්‍යස්ථානයේ නියම අමතර කොටස් සඳහාම වෙන්වූ ගබඩාවක් පවතිනවා. වාහනවල පින්තාරුව සඳහා අප සතුව Colour Machine 03ක් සහ වර්ණ ගැලපීම සඳහාම විශේෂ වූ කාර්මික ශිල්පීන් සිටිනවා.

අනෙකුත් Sterling Aftercare මධ්‍යස්ථාන ඔස්සේ සලසන සේවාවන් පිළිබඳ සඳහන් කළොත්...

දූනගහ-මිනුවන්ගොඩ Auto City මධ්‍යස්ථානයට අමතරව මහර කඩවත, උඩහමුල්ල නුගේගොඩ, නාරාහේන්පිට සහ ගාල්ල යන ප්‍රදේශයන්හි අපගේ මධ්‍යස්ථාන ස්ථාපිත කර තිබෙනවා. එම සියලු මධ්‍යස්ථානවලදී සේවා සපයන්නේ Sterling Aftercare Guarantee වගකීම් සහතිකය ලද වාහන හිමියන්ට පමණක්ම නොවේ. සියලුම වාහන හිමියන්ට අවශ්‍ය පූර්ණ සේවා, කාර්මික අලුත්වැඩියාවන් සිදු කර ගැනීමට සහ වාහන අමතර කොටස්, ඔයිල් වර්ග මිලදී ගැනීමට පුළුවන්. ඔබේ ජපන් වාහනයේ පූර්ණ සේවාවන් සහ සියලුම කාර්මික අලුත්වැඩියාවන් උඩහමුල්ල අපගේ ප්‍රධාන ශාඛාවෙන් ලබා ගන්නට පුළුවන්. ඔයිල් වර්ග මාරු කිරීම සහ අමතර උපාංග සඳහාම විශේෂිත වූ Sterling Aftercare මධ්‍යස්ථානයක් නාරාහේන්පිට පිහිටුවා තිබෙනවා. ඕනෑම ජපන් වාහනයකට අවශ්‍ය අමතර කොටස් ඉන් මිලදී ගන්නට පුළුවන්.

අපගේ ගාල්ල ශාඛාව ඔස්සේ වාහන පිළිබඳ පූර්ණ සේවාවන් සහ සියලුම කාර්මික අලුත්වැඩියා කටයුතු සිදුකර ගැනීමට පුළුවන්. මහර කඩවත Sterling Aftercare මධ්‍යස්ථානය ඔස්සේත් වාහන පිළිබඳ පූර්ණ සේවාවන් සහ සියලුම කාර්මික අලුත්වැඩියාවන් සිදු කරනවා. Sterling Aftercare සෑම මධ්‍යස්ථානයක් ඔස්සේම පරිසර හිතකාමී බවින් යුත් ගුණාත්මක සේවයක් පාරිභෝගික ඔබට සැලසීමට අප පියවර ගන්නවා. ඒ නිසාම අපගේ සියලුම ශාඛාවලට ISO-9001 නිෂ්පාදන තත්ත්ව සහතිකය සහ ISO-14001 පරිසර තත්ත්ව සහතිකය ලැබී තිබෙනවා. ඉදිරියේදී රත්මලානේ Body Shop එකක් සහ නාරාහේන්පිට තවත් Sterling Aftercare මධ්‍යස්ථානයක් පිහිටුවන්නට නියමිතයි.

අනෙකුත් වාහන සඳහා පවතින සේවා මධ්‍යස්ථාන හා සසඳන විට ස්ටර්ලින් Aftercare Centre හි විශේෂත්වයන් මොනවාද?

Sterling Aftercare Centre අපගේ වගකීම වන්නේ පාරිභෝගිකයින්ගේ වටිනා වාහනයට අවශ්‍ය සේවාවන් ගුණාත්මක අයුරින් පිරිනැමීමයි.

අපගේ සේවා මධ්‍යස්ථාන වෙත පිවිසෙන පාරිභෝගිකයන් සඳහා සේවා උපදේශකවරුන් (Service Advisers) ඔස්සේ වාහනයට හිතකර සහ අහිතකර තත්ත්ව, වාහනයේ අමතර උපාංග, වාහනයේ නඩත්තුව, වාහන හිමිකරුවෙක් ලෙස ඔබ දැනගත යුතු අත්‍යවශ්‍ය කරුණු පිළිබඳව දැනුවත්භාවය ලබා දීමට අප කටයුතු සම්පාදනය කර තිබෙනවා. මෙහි පවතින විශේෂත්වය වන්නේ ඔබගේ වාහනය අපගේ සේවා ස්ථානයට ඇතුළත් කළ අවස්ථාවේ පටන් ඔබේ වාහනය සඳහාම විශේෂ වූ සේවා උපදේශකවරයෙක් වෙන්ව කටයුතු කිරීමයි. ඒ වගේම වෙනත් සේවා මධ්‍යස්ථාන මෙන් නොව ස්ටර්ලින් Aftercare මධ්‍යස්ථාන තුළ වාහන හිමිකරුට වාහනය සම්බන්ධව සිදු කරන Service කිරීම් හෝ අලුත්වැඩියාව සම්බන්ධ කටයුතු නිරීක්ෂණය කිරීමට බාධාවක් නොමැති අතර ඊට අවශ්‍ය පහසුකම්ද මෙහි ස්ථාපිත කර තිබෙනවා. වාහන හිමිකරුට අවශ්‍ය පරිදි වැඩබිම වෙත පිවිස එහි ක්‍රියා පටිපාටිය නිරීක්ෂණය කළ හැකි වීම අප සතු විනිවිදභාවයෙන් යුතු සේවාව පිළිබඳ සාක්ෂි දරනවා.

■ **හෂිනි ඉරේෂා ගුණවර්ධන**